# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 11 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 20 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 මාර්තු මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 4.25 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

## 2003 අංක 11 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

එල්. ඩී.—ඕ. 53/2002.

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 20 වන දින]

**කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 2003 අංක 11 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්මික ආරාවුල් පනතේ 31අ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

131 වන අධිකාරයේ 31අ වගන්තිය සංශෝධනය කිරීම.

> "(1අ) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාර වෙනුවෙන් එක් ලේකම්වරයකු ද, එසේ පිහිටුවනු ලැබූ සෑම එක් එක් කම්කරු විනිශ්චය අධිකාරය සඳහා සහකාර ලේකම්වරයකු බැගින් ද පත් කරනු ලැබිය යුතු ය."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තියේ (7) වන උපවගන්තියෙහි "මාස හයක කාලසීමාවක්" යන වචන වෙනුවට "මාස තුනක කාලසීමාවක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ආ වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියෙහි "සහතිකය ඒ සමග විය යුතු ය. අභියාචනය කරනු ලබන්නේ" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට "සහතිකය ඒ සමග විය යුතු ය.", යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :–

"(8) (4) වන උපවගන්තියේ සඳහන් සෑම අභියාචනයක් හෝ ඉල්ලීමක් සමගම අවස්ථාවෝචිත පරිදි අභියාචක හෝ ඉල්ලුම්කරු විසින් ඒ උපවගන්තිය යටතේ තැබීමට නියමිත ඇප මුදල ඔහු විසින් තබා ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරියේ සභාපතිවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් ද විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇඇ වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 ඇඇ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඇඇඇ වගන්තිය ඉවත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 ඇඇඇ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් මේ පනත යටතේ කරන ලද ආඥාවක්", යන වචන වෙනුවට "මේ පනතේ 31ආ වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මත කරන ලද ආඥාවක් හැර, කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් මේ පනත යටතේ කරන ලද ආඥාවක්" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.